Welcome

# LakRuhuna

Get more to your Life….

Welcome

# LakRuhuna

PANSALA E - PUDLISHING

ආයුබෝවන්...

# ලක්රුහුණ

විද්‍යුත් මාධ්‍ය ප්‍රකාශණ

චතුරාර්ය සත්‍යාවබෝධයට ධර්ම දේශනා....

# සිත සනසන අමාගගුල

වැලිගම ශ්‍රී සුගත ශාන්ති සේවා සංසදයේ ගරු යාවජීව සභාපති

## ටී. ඩබ්ලිව්. ඒ. කල්‍යාණ වසන්ත මහතා

විසින් පවත්වන ලද වැඩසටහන් වලදී දේශනා කරන ලද සූත්‍ර දේශනා ඇසුරෙනි.

පරිගණක අකුරු සැකසුම :W. S. A. ඉෂාරා දෙව්මිණී

පිටකවර නිර්මාණය :ලක්රුහුණ.com

ප්‍රකාශනය : ලක්රුහුණ.com

මුද්‍රණය :

සිත සනසන අමාගගුල

නමෝ තස්ස භගවතෝ අර්හතෝ සම්මා සම්බුද්ධස්ස !!!

"සක් දෙවියන්ගේ වැඳුමට භාජනය වන මිනිස් ගුණය"

LAKRUHUNA

## සිත සනසන අමාගගුල

අද මැදින් පුර පෝ දිනයයි. මීලඟ පොහොය බක් මස පුර පෝදිනය වේ. ඒ සමගම සිංහල හින්දු අළුත් අවුරුද්ද උදාවේ. එම ජාතික උත්සවය බෞද්ධ ජනතාවගේද වාර්ෂික උත්සව අතරින් එකකි. අප රටේ මෙම ජාතික උත්සවයට බුදු දහමේ අභාෂයද ලැබී තිබේ. එම උත්සවයට සූදනම්වන බෞද්ධ ජනතාවට ඉතා වැදගත්වන ධර්ම මාතෘකාවකි. අද ධර්ම පත්‍රිකාවේ සදහන්වන මාතෘකාව.

බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර ජේතවන විහාරයේ වැඩවසන එක්දිනක භික්ෂූන් වහන්සේ අමතා "මහණෙනි පෙරවූවක් කියමි..." යනාදී වශයෙන් භික්ෂූන් වහන්සේ අමතා අපූරු සිද්ධියක් වදාළහ. දිනක් සක්දෙවිඳු නන්දන උයන නැරඹීමට යාමට මාතලී නම් වූ තම රථචාර්ය දිව්‍ය පුත්‍රයා අමතා රථය සූදනම් කිරීමට උපදෙස් දී වෛජයන්ත ප්‍රාසාදයෙන් සියලු දිව්‍යාභරණයෙන් විභූෂිතව බසින ගමන් දෑත් එක්කොට ඇඟිලි බැඳ හැම දිශාවක්ම නමදිනු දැක, මාතලී දිව්‍ය පුත්‍රයා සක්දෙවිඳු අමතා "වේදත්‍රය හදාරණ සියලු භූ ලෝකවාසීහුද, ක්ෂත්‍රියයෝද, සතරවරම් දෙව් මහරජහු ද, යසස් ඇති දෙවියෝද, ඔබ වඳිති. එසේ වූවද සක්දෙවිඳුනි, ඔබ යමෙකු හට වැන්දේ නම් ඒ කාටද? කිනම් සත්වයෙකුටදැ"යි විමසීය.

එවිට සක්දෙවිඳු ඊට පිළිතුරු වශයෙන් "මාතලිය ත්‍රිවේදය හදාරණ පොළෝතල වාසී සියල්ලෝද ක්ෂත්‍රියයෝද සතරවරම් දෙව්මහරජහුද යශස් ඇති දෙවියෝද මට වඳිති."

"මමද ශීලයෙන් සමන්විත වූ බොහෝ කලක් මුළුල්ලෙහි එකඟ කළ සිත් ඇති බඹසර වාසය කිරීමේ නිරත වූ පැවිද්දන් මනාකොට වදිමි"

"එසේම, පින්දහම් කරණ සීලවන්ත වූ ගෘහස්ථ යම් උවසුකෙනෙක් (උපාසක ගුණයෙන් යුතු කෙනෙකු) ධාර්මිකව අඹුදරුවන් පෝෂණය කරයිද, මම ඔවුන් නමදිමි."

එවිට මාතලී දිව්‍ය පුත් "සක්දෙවිඳුනි ඔබ යම්කෙනෙකු වඳීද ඔහු ලෝකයේ ශ්‍රේෂ්ඨයෝ මය. එබැවින් ඔබ යම්කෙනෙකු වඳින්නේනම් මම ද ඔවුන් නමදිමි." යි පැවසීය.

ඉහතින් දැක්වූ ප්‍රවෘත්තිය සක් දෙවිඳුන් වාසය කරන විජයොත් පහය ආසන්නයේදී සක්දෙවිඳු හා මාතලී රථාචාර්‍ය්‍ය දිව්‍ය පුත්‍රයා, අතර ඇති වූ කථාබහකි. තථාගතයන් වහන්සේ එය භික්ෂූන් වහන්සේ අමතා " සක්ක නමස්සන සූත්‍රය" නමින් වදාළහ.

අප බෞද්ධ ජනතාව විවිධ ආකාරයෙන් වැඳීම් පිදීම් කරති. සිංහල අළුත් අවුරුද්ද උදාවත්ම බෞද්ධ ජනතාවද එම චාරිත්‍ර අතරට වැඳීමට විශේෂ තැනක් දෙති. වෙනදාටත් වඩා වැඳීමේ චාරිත්‍රය ඉතා ඉහළින් සිදුවෙති. විශේෂයෙන් මෙම චාරිත්‍රය ගිහියන්ට විශේෂ වූ බවක් ඒ දිනකීපයේදී පැහැදිලි වේ.

වැඳිය යුක්තන් අතරින් ඉහළම සුදුස්සන් වන්නේ තථාගතයන් වහන්සේලාය. ඉන්මෙහා පසේ බුදුවරු ආර්‍ය්‍ය මහා සඟරුවන සහ සම්මුති මහා සංඝයා වහන්සේලාය. සිල්වතුන්ය. ගුණවන්තයෝය.

අවුරුද්ද උදාවූ දවසටත් පුණ්‍ය කාලයේදී ත්‍රිවිධරත්නයට වැඳීමට කාලය වෙන්කර ඇත. ඉන්පසු නිවසේ සහ අනෙක් වැඩිහිටියන්ට වැඳීමට

අවස්ථාව උදවේ. මේ සියලු වැඳීම් ඇතැම්විට අවබෝධයෙන් සහ අනවබෝධයෙන් සිදුවනවා විය හැකියි. එනමුත් ඉහත සඳහන් වූ සූත්‍රදේශනාවට අනුව සක්දෙවිඳුන්ගේ වැඳීමෙහි විශේෂත්වයක් ඇත. එනම්, සක්දෙවිඳුන්ගේ වන්දනයට භාජන වීමට අවශ්‍ය වූ අඩුම සුදුසු කම මේ ගාථාවෙන් පැහැදිළි වීමයි.

යේ ගහට්ඨා පුඤ්ඤකරා - සීල වන්තෝ උපාසකා

ධම්මෙන දාරං පෝසෙන්ති - තේ නමස්සාමි මාතලීති

යම්කිසි ගිහියෙක් දැහැමිව සිල්වත්ව පිංකරමින් අඹුදරුවන් පෝෂණය කරයිද ඒ ඔවුන්ට වැඳීමට සුදුසුකමයි. එවිට මාතලිය කියන්නේ, සක්දෙවිඳුනි ! ඔබ යම් කෙනෙකුට වඳින්නේ නම් ඔවුන් ලෝකධාතුවේ ශ්‍රේෂ්ඨයෝය. ඒ නිසා මමත් ඒ අයට වඳිමි.

වැඳුම් ලබන, වඳින දෙකොට්ඨාශයටම මාතලී දිව්‍ය පුත්‍රයා මෙහිදී ගත් තීරණය ආදර්ශයකි. එළඹෙන සිංහල අවුරුද්දට සූදානම්වෙන අපේ ජනතාවටද මෙයින් හොඳ පාඩමක් උගත හැකිවේ. වඳින්නන් වාලේ වඳින්නන්ටද වැඳුම් ලබන්නන් වාලේ වැඳුම් ලබන්නන්ටත් කදිම උපදේශයකි. වැඳීමට සුදුස්සන් සෙවීමට වඩා වැඳීමට සුදුසුකම් සෙවීම මෙහි මිනුම් දණ්ඩ බව සක්දෙවිඳුගේ තීරණයයි.

සක්දෙවිඳුගේ වැඳීමට එදා මිනිස්ලොව සිටි රජවරු සිටුවරු තෝරාගත්තේ නැත. එතැන වැදගත් පණිවුඩයකි. මුළු මහත් ලෝකයේම සියලු ප්‍රශ්ණ අතරින් එක කාරණයකට හැර සියල්ලටම පැතිදෙකක් ඇත. එසේ පැති දෙකක් නැති එකම කාරණය වන්නේ "මනුෂ්‍ය" යන වචනයයි.

අපාද ද්විපාද, චතුෂ්පාද, බහුප්පාද වශයෙන් බෙදෙන ලොව වෙසෙන සතුන් අතරින් මනුෂ්‍යයා යන ශබ්දයෙන් ප්‍රකාශවන පුද්ගලයා ශ්‍රේෂ්ඨය. එබැවින් එය අන්තර් ජන්ම පරිශ්‍රමයෙන් (උපදින උපදින ආත්මයක් පාසා උත්සාහයෙන්) දුකසේ ලබාගතයුතු දුෂ්කර "භව ප්‍රතිලාභයක්ය"යි බුද්ධවචනයයි.

මනුෂ්‍යයකු වශයෙන් විඳින, ලබන, සැප සම්පත් පිරිහී ගියද උදාර ගුණයෙන් ශෝභමාන වූ කැලැල් නැති චරිතය ශ්‍රේෂ්ඨ චරිතයකි. ඔහුගේ සල්ලි නැතිකම, උගත්කමේ අඩුව, ඇඳුම් හෝ කුලය, ශ්‍රේෂ්ඨත්වයට කැලලක් නොවේ. එසේම ධනවත්කම කුලවත්කම පංතිභේදය ප්‍රසිද්ධකම මාධ්‍ය නාලිකාවල නිතර පෙනීසිටීම හෝ එයින් නැගෙන ව්‍යාජප්‍රභාවය ශ්‍රේෂ්ඨත්වයට හේතුවක්ද නොවේ.

චරිත ගතියෙන් මනුෂ්‍ය තිරිසනෙකුට වුවද මනුෂ්‍ය ප්‍රේතයෙකුට වුවද මනුෂ්‍ය නේරයිකයෙකුට වුවද උත්සාහයෙන් ඉහතින් සඳහන් කල සම්පත් ලබාගත හැකිය. එසේ වුවද ශ්‍රේෂ්ඨත්වය ඔහුට ගෝචර නොවේ. එය දිව්‍යමය දිව්‍ය වන්දනීයමය. යහපත් චරිත බලයෙන්ම නිමකරගතයුතු මහේශාක්‍ය තනතුරකි.

| | | |
|---|---|---|
| නජ්ච්චා වසලෝ හෝති | = | උපතින් වසල නොවේ |
| නජ්ච්චා හෝති බ්‍රාහ්මණෝ | = | උපතින් උසස් නොවේ |
| කම්මනා වසලෝ හෝති | = | කරනදේ අනුව වසලවේ |
| කම්මනා හෝති බ්‍රාහ්මණෝ | = | කරනදේ අනුව උසස්වේ |

බෞද්ධ ලෝකයා නොව සියලු මානව සංහතියම සිත, කය, වචනය යන තුන්දොරින්ම මෙම භාෂිතයට සහ වදළ උත්තමයාට නැමදිය යුතුය.

ඉහත කී චරිත බලය මගින් නිර්මානය වන වන්දනීයත්වය ප්‍රකට වන ඔහු හෝ ඇය හැඳිනියහැකි කරුණු බොහෝ ඇත. එනම්, ආයු, වර්ණ, සැප, බල, ඥාණ, ධන ආදියයි. මේවා යමෙක් ලග ඇත්ද ඔහු හෝ ඇය සසරදී කරනලද පූර්වකෘත පුණ්‍ය බලයයි. වැඳීමෙන් අභිවාදනයෙන් ලැබෙන කුසලකර්ම විපාකද ඉහතකී ධර්මතාවයන් බව ධම්මපදයේ සහස්ස වග්ගයේ එන

අභිවාදන සීලිස්ස ...... යනාදී වූ ගාථාවෙන් දැක්වේ. එමෙන්ම හැමතැනදීම ගරුසරු ලැබූ චිත්ත ගෘහපති තුමාගේ ගිහි චරිතයද කදිම නිදසුනකි. එසේ වූ චරිත ශක්‍රදේවේන්ද්‍රයාගේ වන්දනයටද භාජනය වූ බවට සැක නැත. බුදුහිමියන්ගේ බුද්ධ භාෂිතයට අනුව සක්දෙවිඳු මනුෂ්‍ය ප්‍රජාවට වැඳීම කලේ ඉහත කී චරිතබලය ඇති උත්තම ගුණධර්ම දරණ ත්‍රිවිධරත්නය සරණ ගිය දැහැමි සිල්වතුන්ටය.

අද සිංහල අවුරුදු චාරිත්‍ර වලදී වැඳුම්ලබන්නේ මෙම ගුණයෙන් යුතු ඇත්තන්ද? යන්න විමසීම කාලෝචිතවේ.

මේ සඳහා මා ඇසූ එක් සත්‍ය කථාවක් මෙහිදී සටහන් කරනු කැමැත්තෙමි. ධාර්මිකව දෑතේ මහන්සියෙන් රැකියාවක් කල එක්තරා ගෙදරක ප්‍රධානියෙකු දිනපතා මත් පැන් බීමට පුරුදු වී රැකියාවේ ධාර්මික කමද නැතිවන පරිදි සවසට ගෙදර ගොස් ඔහුගේම වචනයෙන් කියන්නේ නම් අඹුදරුවන්ට "වධක ස්වාමි යෙක් වී" කලක් ගතවිය. අංගුත්තර නිකායේ

'සත්ත භරියා' සූත්‍රයෙන් දිනක් සිහිනුවනින් බණ අසා එදින පටන් මම "වධක ස්වාමියෙක්" නේදැයි සිතා මත්පැන් බීම නතර කොට ඇත. ඒ ආසන්නයේම සිංහල අවුරුද්ද උදාවිය. ඊට පෙර ඔහුගේ බිරිඳ ඔහුට සිංහල අවුරුද්දට එක්වරක්වත් වැඳීම කර නැත. බීම නතර කොට සැබෑ ස්වාමියෙක් වූ අවුරුද්දේ ඔහුට සිය බිරිඳ දෙවාරයක් වැඳ ඇත. ඒ බව ඔහු සතුටින් අදත් කියයි. අද ඔහු "වධක ස්වාමියෙක්" නොවේ මහත්මයෙකි. සිල්වත්ය, පින්දහම්කරයි. දැහැමින් අඹුදරුවන් පෝෂණය කරයි. දෙවියන්ගේ වන්දනයටද ලක්විය හැකිය.

මේ සත්‍ය කථාප්‍රවෘත්තියද සිංහල අවුරුදු චාරිත්‍ර සිදුකරන දෙමාපියන්ට දූදරුවන්ට ස්වාමි සේවකයන්ට චාරිත්‍ර සිදුකිරීමටපෙර දැනගැනීම දේවතා ප්‍රසාදය ඇති නව අවුරුදු චාරිත්‍රයකට පසුබිමකි.

පස්පවු කරන්නන්ට වැඳීම ධර්මයට ද කරන අගෞරවයකි. එබැවින් කටගොන්නක් මත්පැන් බීගත් ගෙදර ප්‍රධානීන් වැඩිමහලු සහෝදරයන්, මාමා සහ අප්ප, බාප්පාවරුන් තම දූදරු ඥාතීන් ලවා වන්දවා ගැනීමද, එපරිදි ස්වාමිවරුන් සේවකයන් ලවා වන්දවා ගැනීම ආත්ම වඤ්චාවකි. දේවතා අප්‍රසාදයටද හේතුවකි. නෑකම සහ වයස වැඳීමට එකම සුදුසුකම යයි බුදුහිමියන් වදාළේ නම් සක්දෙවියන්ට වැඳීමට සිදුවන්නේ ලොව සිටින සියලුම මනුෂ්‍යයින්ටය. වඳින්නේ කාටදැයි මාතලී දෙව්පුතු විමසූවිට " ශීලයෙන් සමන්විත වූ දැහැමි වූ පින්දහම් කරන යහ පෝෂණයෙන් අඹුදරුවන් රකින යම් ගිහි උත්තමයෙක් ඇත්නම් මම ඔවුනට වඳිමි." යනුවෙන් පැවසුවේ මේ ගැටළුවට පිළිතුරු වශයෙනි. ගුණධර්මය ලොවේ උත්තමභාවයේ මූලික උල්පතයි.

වයසින් වැඩි හිටියන්ට වැඳීම නරක දෙයක්යැයි මෙයින් නොකියමි. වයසින් වැඩිවත්ම ගුණයෙන්ද වැඩිවිය යුතුමය. එවිට  වැඳීමට අවකාශය සකස්වේ.

ත්‍රිවේදය හදරණ පොළෝතල වැසි සියල්ලන්ද, රජවරුද, සතරවරම් දෙවියන්ද, සක්දෙවියන්ගේ දිව්‍යානුභාව පුණ්‍ය බලයට වඳිති. එසේ වූ සක් දෙවියන් තෙරුවන් සරණගිය පස්පවින් වැලකුණා වූ උතුම් පුද්ගලයාට වඳිනුයේ මුළුලොව වාසීන්ගෙන් පස්පවින් වැළකුනා වූ ගුණධර්මබලයෙන් යුතු පුද්ගලයාම ලොවින් උතුම් හෙයිනි. දෙවියන්ගේ වන්දනයටද සුදුසු හෙයිනි. මිනිස්ලොව "වීරයා" යනු කාගෙනුත් ගරුබුහුමන් ලබන්නාය. ඒ තෙරුවන් සරණගිය දැහැමියාය.

ඒ බව මහා සමය සූත්‍රයේ,

**"යමෙක් බුදුන් සරණ ගියාහුද ඔවුහු අපායට නොයෙති. මනුෂ්‍ය ශරීරය හැර දිව්‍ය සමූහයා සම්පූර්ණකරයි. දිව්‍ය කයක් ලබා දෙව්ලොව උපදී" යනුවෙනි.**

එබැවින් බුදුහිමියන් සරණගිය අප, එළඹෙන නව සිංහල හින්දු අලුත් අවුරුදු උත්සවයට සූදානම්වන මෙම මැදින් පුරපෝදිනදී නව හැඟීමකින් යුතුව කටයුතු කිරීම මෙම ධර්මයට අනුව යුතුවේ.

සිංහල හින්දු අළුත් අවුරුදු චාරිත්‍ර උත්සවයට සූර්යයා මඞ්ගල්‍යය යයිද හඳුන්වති. හින්දුන් එම ආගමට අනුව කටයුතු කරති. බෞද්ධයා බුදු දහමට අනුව කළයුතුවේ. අප විශ්වාසකරනුයේ ලොව පහල වූ මහා

තත්වධර්මවාදියාණන් වූ තථාගතයන් වහන්සේගේ උතුම් දහමයි. එය ආගමක් නොවේ දහමකි. අනුකරණය කිරීම අපට අයිති නැත. විමසීම අපලගතිබිය යුතු මූලික ලක්ෂණය වියයුතුයි. තරගයක් අපටනැත. තවත්කෙනෙක් කරන නිසා අපද කලයුතුයි යන හැගීමෙන් ඉවත්වී, විමසීම ඇතිකරගත යුතුයි. එසේ නොවුවහොත් අප "ෂැඩෝස්ටාර්" (කැපීපෙනෙන අනුකරණ තරුවක්) එකක් වීමට උත්සාහ ගත්තා වැනිවේ.

මෙහිදී අප කථාකරනුයේ මෙම සූත්‍රයේද අඩංගු ගිහි පැවිදි භේදයේදී වැඳීමේ පදනම පිළිබඳව නොවේ එය මීටත්වඩා පුළුල්වේ. අවුරුදු චාරිත්‍රවලදී අප සමාජයේ ඇතැමුන්ගේ මෙතෙක් පැවති දුර්වලකම වූ පස්පවින් මෙම උතුම් දින කීපය කිළිටි කරගැනීම පිළිබඳවයි. බෞද්ධයාට ඒ දින කිපයට පමණක් දුසිරිතට අවසරය දෙනතැනක් බුදු දහමේ කොතනකවත් නැත. අනිත් දිනයන්ටත් වඩා මෙම දින කීපය දැහැමි සහ නිවැරදි විය යුතුවන්නේ මෙදින වැඩිහිටියන් වැඳීම කරනුයේ සිංහල චාරිත්‍රයන්ට අනුව බුලත් අතක් දී වැඳීමෙනි. බුලත් අත අපේ සමාජයේ උතුම් වස්තුවකි. ඒ උතුම් බුලත් අත දී වයසින් වැඩිහිටිවුවද බේබද්දෙකුට වැඳීම කරන්නේ නම් බුලත් අතද බාල්දු කිරීමක් සේ නොහැගේද. උතුම් ගුණයන්ගෙන් යුතු වැඩිහිටියන්ටද වැඳීමට එම බුලත් අතම භාවිතා කිරීමට වීම බලවත් අසාධාරණයකි. ඒ නිසා සියල්ලන්ම තේරුම්ගතයුතුයි. වැඳීම සිදුකිරීමත් වැඳුම් ලැබීමත් ඉතා සාධාරණව කලයුතු ක්‍රියාවක් බවට.

වැඳීමෙන් ගරුකිරීම බුද්ධ ධර්මයට අනුව බලවත් පිනකි. එසේම වැඳුම් ලැබීමට සුදුසුකම් ලැබ වැඳුම් ලැබීමද පිනකි. ලෝකයේ කිසිවෙක් තමනට වඳින්නට යයි බලෙන් කියන්නේ නැත. වැඳීමට හේතුව සිතා එය තීරණය

කරන්නේ වඳින පුද්ගලයාය. වැඳුම් ලබන්නා ඒ වැඳුම ලැබීමට තමන් සුදුසුදැයි හදවතට එකඟව සිතිය යුතුය. කර්මානුරූපව එයට පිළිතුරු ලැබෙනතුරු නොසිට ඊට පෙර පිනට එකඟ කර්මයක් සිදුකරගැනීම බුද්ධ අවවාදයයි. ඒ බව දසධම්ම සූත්‍රයේ එන "කම්මස්ස කෝම්හි, කම්මදායාදො, කම්මයෝනි, කම්මබන්ධු, කම්ම පටිසරණො ..........." යනාදී පාඨයෙන් කර්මය අයිතිකොට, දායාදකොට, යෝනි (උපකරණකොට), නෑයා කොට, පිළිසරණකොට වාසයකරණ බව සිහියේ තිබිය යුතුය.

බුදුන් සරණගිය පුද්ගලයා යනු බුදුහිමියන් අවබෝධයෙන් යුතුව පිළිගත්තා යන අර්ථයයි. අවබෝධය නැතිව එම සරණ යෑම ඵල රහිතවේ. මලක්, පහණක් පූජාකරනවිට එම මල එම පහණ අනිත්‍ය ස්වභාවයට පත්වන අයුරු මෙනෙහි කරමින් පූජාකිරීම නියම බුද්ධ පූජාවයි. එසේ නැතිනම් එය මල් පහන් ප්‍රතිමාව ඉදිරියේ ගොඩගැසීමකි. අවබෝධයෙන් පූජාකිරීම අර්ථ කර්මඵල සහිතවේ.

වඳින්නන්ට, වැඳුම් ලබන්නන්ට, දෙව්ලොව සහ අපාය තීරණය වන්නේ මේ ආකාරයට බව තේරුම් ගනිමු. සක්දෙව්දුන්ද වඳිනුයේ ගුණධර්මයෙන් හදපිරි පුද්ගලයාටය. ඒ සුදුසුකම අපද නිරන්තරව ඇතිකරගැනීමට අධිෂ්ඨාන කරගනිමු. හැම දෙනාටම සුභ නව වසරකට ආසිරි, ගුණධර්මබලයෙන් ලැබේ දෙවියන්ගේ වැඳීමටද ලක්වීමට මනුෂ්‍යයෙකුවීමට සිතුවිලි පහළවේවා!

සාදු ! සාදු !! සාදු !!!

සිත සනසන අමාගඟුල

www.lakruhunu.com